## දෙවන වසර

සන්නස සමග අපි වසරක් ගෙවා ආවෙමු ගෙවුණ වසර තුළ අපි අපේ ශක්ති ප්‍රමාණයෙන් සන්නස ගොඩ නැගුවෙමු ඒ සඳහා අපට ඔබේ සහය ද නොඅඩුව ම ලැබුණි. ඒ පිළිබඳව අපි ඔබට කෘතඥ වෙමු. අපේ පාඨකයනට වඩා හොඳ දෙයක් ලබා දීම අපේ එකම අරමුණ විය.

සන්නස සමග අපි අද නව පියවරක් අරඹන්නෙමු. පත්තර කෙරහි බැඳුනා වූ නොසන්සිඳෙන ඇල්ම නිසා ම වෙහෙස නොබලා මේ ගමන යන්නට අපි අදිටන් කරගෙන සිටිමු. ඔබ අප කෙරෙහි දැක්වූ විශ්වාසය මේ ගමනේ දී ත් නොබිඳින බවට අද මේ මොහොතේ ද ශපථ කරමු.

### අපේ නව ලිපිනය

22 Lorne Street
Lalor Vic 3075 Australia

Tel/Fax : 03 9402 5380


සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**
ශ්‍රීනාත් මද්දුමගේ
අසෝක සුබසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055
**WA** Kapila Hemantha Balage 08 9456 1972
**QLD** Ananada Samaratunga 07 3372 7953
**ACT** Asoka Nimalasiri 0439 925 241
**SA** Chandta Eeriyagama
**TAS** Anura Seneviratne 03 6327 4259



**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380



පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත






# කොටි ආක්ෂක අංශ කනෙන් රිංගති

**කොළඹ** අධි ආරක්ෂිත කලාපයක පිහිටි රාජ්‍ය ආරක්ෂාවේ මර්මස්ථානයක් ලෙස සැලකෙන කොළඹ යුද හමුදා මූලස්ථානයට ඉතාමත් උපක්‍රමශීලි ලෙස ඇතුළු වී බෝම්බයක් පුපුරුවා හැර යුද හමුදාපති ලුතිනන් ජනරාල් සරත් ෆොන්සේකා මහතා ඝාතනය කිරීමට තරම්, කොටි සංවිධානය දියුණු ආරක්ෂක තත්ත්වයක් කරා ගමන් කිරීම ශ්‍රී ලංකාවේ ආරක්ෂාවේ මහ මොළකාරයන්ට දවල් තරු පෙනෙන තරම් ඇඟ කිළිපොලා යන සිද්ධියක් බවට එය පත් වී ඇත.

***<u>හමුදාපතිවරයාව ඝාතනය කිරීමට පැමිණි මරාගෙන මැරෙන කොටි කාන්තාව පිළිබඳව මේ වනතුරුත් නිශ්චිත තොරතුරක් අනාවරණය කර ගැනීමට රහස් පොලීසියට හැකියාව ලැබී නැත. වවුනියාවේ පදිංචි අනෝජා කුගනේශ්වරී නමැති කාන්තාව මෙම මරාගෙන මැරෙන කොටි කත බවට මුලින් තොරතුරු ලැබී තිබුණත් එය සනාථ කර ගැනීමට රහස් පොලිස් නිලධාරීන්ට හැකියාව ලැබී නැත.</u>***

රටේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා රාජ්‍ය බුද්ධි බල මණ්ඩලය, රහස් පොලීසිය, යුද හමුදා රහස් තොරතුරු අංශය, පොලිස් බුද්ධි අංශය ඇතුළු විවිධ නාමයන්ගෙන් හැඳින්වෙන ඔත්තු අංශ රාශියක් ඇතත්, ඒ සියලුම ඔත්තු අංශවලට සිටින මහදැන මුත්තලාගේ කනෙන් රිංගා ගොස් හමුදා මූලස්ථානයේ අධිබලැති බෝම්බයක් පුපුරුවා හැරීමට තරම්, කොටි සංවිධානයේ ටොසී රහස් ඔත්තු අංශයේ නායක ඒ ශිවශංකර් හෙවත් පොට්ටු අම්මාන්ගේ නායකත්වයෙන් යුතු ඔත්තු අංශය සමත් වී ඇත.

එමඟින් ශ්‍රී ලංකා රජයේ සියලුම ඔත්තු අංශ සහ ආරක්ෂක විධි විධාන පොට්ටු අම්මාන්ගේ එක ඔත්තු අංශයකට අන්ත පරාජයක් හිමි වී ඇත්තේ, ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක බලධාරීන්ට බ්ලේඩ් තලයක් අරගෙන බඩ කපා ගැනීමට තරම් ලැජ්ජාවක් ඇති කරවමිනි.

මහජන මුදල් වැය කර දෙස් විදෙස් රට රාජ්‍යවලට යවා, රජයේ ඔත්තු සේවා නිලධාරීන් පුහුණු කර තිබුණත් විනාශයක් වීමට පෙර කල්වේලා ඇතිව එය හෙළිදරව් කර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබී නැත.

එක් පැත්තකින් එය ඔත්තු අංශවල අදක්ෂතාව පෙන්නුම් කිරීමකි. විනාශයක් සිදු වූ පසු එය සිදු වූයේ කොහොම ද? එයට පැමිණි පුද්ගලයන් කවු ද? එවුන් සුදු ද? කළු ද? ඔවුන් සිටියේ දත් මැදලා ද? ඔවුන් පැමිණ ඇත්තේ කුමන පාරෙන් ද? ඔවුන් කාලා බීලා තියෙන්නේ කුමන හෝටලයකින්ද? වැසිකිළි ගිහින් ඇත්තේ, කොයි වැසිකිළියෙන් ද? යනාදි දේවල් සොයා ගනිමින් පශ්චාත් පරීක්ෂණ පැවැත්වීමට නම් රජයේ ඔත්තු නිලධාරීන් හරි දක්ෂ ය. නමුත් එවැනි ඔත්තු සේවයකින් ඇති පළ ප්‍රයෝජනය කුමක් ද? අවශ්‍යව ඇත්තේ විනාශයක් කිරීමට පෙර එය සොයා ගැනීමට පුළුවන් ඔත්තු අංශයකි. රජයට අද නැත්තේ එවැනි දෙයකි. හරි නම් ඔත්තු අංශ ගැන පාඨමාලා හැදෑරීමට හා පුහුණු කිරීමට රජයේ ඔත්තු අංශයේ නිලධාරීන් කොන්ත්‍රාත් ක්‍රමයට හෝ පොට්ටුඅම්මාන් ළඟට යැව්වාට වරදක් නැත.

මන්ද ඔහු ඔත්තු අංශ පිළිබඳව රජයේ සිටින ඔත්තු මහදැනමුත්තාලට වඩා බොහෝ දේවල් දන්නා බැවිනි. ඔත්තු සොයන්නේ කෙසේද? ඒ සඳහා ක්‍රියාත්මක වන්නේ කෙසේද? ඒ සඳහා ඔත්තු නිලධාරියෙකුට හෝ නිලධාරිනියකට තිබිය යුතු ගුණාංග සහ හැකියාවන් පිළිබඳව ඔහු හොඳට උගන්වනු ඇත.

පසුගිය කාල පරිච්ඡේදය දෙස බලන විට රජයේ ඔත්තු අංශවලට වඩා කොටි ඔත්තු අංශය මොනතරම් දියුණුවක් ලබා ඇත් ද? යන්න ඕනෑම අයෙකුට මනාව වැටහෙනවා ඇත. ඒ අතින් ගත් කල රජයේ ඔත්තු අංශය තවමත් ඉන්නේ ඉතාමත් දිළිඳු තත්ත්වයක ය.

යුධ හමුදාපතිවරයාව ඝාතනය කිරීම සඳහා කොටි සංවිධානය දැරූ ප්‍රයත්නයෙන් එය සනාථ විය. ඔහුට අද වනවිට කෙසේ හෝ සිය ජීවිතය ආරක්ෂා කරගෙන තවදුරටත් ජීවත්වීමට වාසනාව ලැබී ඇත.

නමුත් හමුදාපතිවරයාව ඝාතනය කිරීමට පැමිණි මරාගෙන මැරෙන කොටි කාන්තාව පිළිබඳව මේ වනතුරුත් නිශ්චිත තොරතුරක් අනාවරණය කර ගැනීමට රහස් පොලීසියට හැකියාව ලැබී නැත. වවුනියාවේ පදිංචි අනෝජා කුගනේශ්වරී නමැති කාන්තාව මෙම මරාගෙන මැරෙන කොටි කත බවට මුලින් තොරතුරු ලැබී තිබුණත් එය සනාථ කර ගැනීමට රහස් පොලිස් නිලධාරීන්ට හැකියාව ලැබී නැත.

ඒ අනුව බලන කළ හමුදාපතිවරයාව ඝාතනය කිරීමට බඩේ බෝම්බ බැඳගෙන පැමිණි කාන්තාව කවුරුද යන්න රහස් පොලීසියට බරපතල ප්‍රශ්නයක් වී ඇත.

මෙම කාන්තාව කොළඹ වේල්ල වීදියේ තාවකාලික ලැගුම් හලක ලැගුම් ගෙන සිටි බවට ලැබුණු තොරතුරු මත එම ලැගුම් හලේ කළමනාකාරවරයාව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කර ඇතත්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි තොරතුරක් ඔහුගෙන් ලබා ගැනීමට පරීක්ෂණ නිලධාරීන්ට හැකියාව ලැබී නැත.

මරාගෙන මැරෙන කොටි කත මාස කිහිපයක ගැබිණියක් බවට තොරතුරු ප්‍රචාරය වුවත්, එය සත්‍යයක් ද යන ගැටලුව ද රහස් පොලීසිය හමුවේ පැන නැගී ඇත. ඇය මතුපිටට ගැබිනියක් ලෙස පෙනී ගියත්, සමහර විට එසේ පෙනී ඇත්තේ බඩේ බැඳගෙන සිටි මරාගෙන මැරෙන බෝම්බ කබාය නිසාද යන්න පරීක්ෂණ නිලධාරීන්ගේ විමසුමට භාජනය වී ඇත.